රුහුණ විශ්වවිද්‍යාලය

කළමනාකරණ හා මූල්‍ය පීඨය

ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පාඨමාලාව 1000 ස්ථලය පළමු සමාසික අවසාන පරීක්ෂණය

(සැප්තැම්බර් / ඔක්තෝබර් 2020)

අධ්‍යයන වර්ෂය 2018/2019

**BBA 11013 - කළමනාකරණ මූලධර්ම** කාලය : පැය තුනයි

**ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 07කින් සමන්විත වේ.**

**ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

1. i. කළමනාකරුවෙකුට අවශ්‍ය කලමනාකරණමය නිපුණතාවයන් මොනවාද? මෙම නිපුනතාවයන් කළමනාකරණ මට්ටම් අනුව වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. "ටේලර්ගේ විද්‍යාත්මක කළමනාකරණ මූලධර්මයන් බොහෝ වැඩ පරිසරයන් තුළ දැනටත් දක්නට ලැබේ., මින් අදහස් කරන්නේ පසුගිය කාලය තුළ කළමනාකරණ චින්තනය වෙනස් වී නොමැති බවයි." උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. හෝතෝන් අධ්‍යයන හා එය කළමනාකරණ භාවිතයට කරන ලද දායකත්වය විස්තර කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 14)

2. i. ආයතනික පරිසරය කළමනාකරුවෙකුට මෙතරම් වැදගත් වන්නේ ඇයි? සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුළ අඩංගු මූලිකාංගයන් හඳුනාගෙන ඒවා විස්තර කරන්න.

(ලකුණු 04)

ii. සංස්කෘතිය යන්න නිර්වචනය කරන්න. කළමනාකරුවන් ආයතනයක් තුළ ආයතනික සංස්කෘතියක් ස්ථාපිත කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. ආචාර විද්‍යාත්මක කළමනාකරණයන් සඳහා වැදගත්වන මූලධර්මයන් කිහිපයක් නම්කර ආයතනයක කළමනාකරණමය භාවිතයන් සඳහා එම මූලධර්ම වැදගත්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 14)

3. i. සංවිධානකරණ ක්‍රියාවලිය තුළින් සමස්ථ සංවිධානයක විවිධ ප්‍රතිලාභ ලබා දෙන සංවිධාන ව්‍යුහයක් නිර්මාණය කරයි. උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. දෙපාර්තුමේන්තුකරණ ක්‍රම 04ක් නම් කර ඉන් එකක වාසි අවාසි විස්තර කරන්න.

(ලකුණු 04)

iii. සීමා මායිම් රහිත සංවිධානයක් යන්න නිර්වචනය කර එහි වාසි අවාසි සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 14)

4. i. සරල උදාහරණයන් භාවිතා කරමින් සන්නිවේදන ක්‍රියාවලිය විස්තර කරන්න.

(ලකුණු 04)

ii. "අවිධිමත් සන්නිවේදනය, විධිමත් සන්නිවේදනයට වඩා ඵලදායි විය හැක". ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 04)

iii. තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සංවිධාන ක්‍රම මොනවාදැයි හඳුන්වා, නූතන සංවිධාන කළමනාකරණයට වැදගත් වන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 14)

5. i. අභිප්‍රේරණ සංකල්පය කෙටියෙන් විස්තර කර, අභිප්‍රේරණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. ඩග්ලස් මැක්ග්‍රෙගර් ට අනුව X සහ Y කළමනාකරුවන්ගේ ගතිලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. කළමනාකරුවන් වර්තමානයේ මුහුණ දෙන සේවක අභිප්‍රේරණ ගැටළු මොනවාද?

(ලකුණු 06)

(මුළු ලකුණු 14)

6. i. සැළසුම්කිරිම හා පාලනය අතර පවත්නා සම්බන්ධතාවය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. පාලන ක්‍රියාවලියේ අඩංගු වැදගත් අංගයන් මොනවාද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. ආයතනික ක්‍රියාකාරිත්වය පාලනය කිරීමට යොදාගත හැකි උපකරණයන් විස්තර කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 14)

7. පහත සඳහන් 04ක් පිළිබදව කෙටි සටහන් ලියන්න.

I. අධිකාරිය හා බලය

II. කළමනාකරණ හා පරිපාලනය

III. ආයතනික අභිමතාර්ත හා අරමුණු

IV. කළමනාකරණය විද්‍යාවක්ද? කලාවක්ද?

V. කළමනාකරණ ජාලය

VI. ප්‍රධාන බලය ලැබෙන මූලාශ්‍ර

VII. පාලන අවකාශය

(එක් කොටසකට ලකුණු 3 ½ බැගිනි)

(මුළු ලකුණු 14)